CPA

CENTRE FOR POLICY ALTERNATIVES

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය

மாற்றுக் கொள்கைகளுக்கான நிலையம்

# අපරාධ නඩු විධාන සංග්‍රහ පනතට යෝජිත සංශෝධන පිළිබඳ විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයෙහි ප්‍රකාශය

**වර්ෂ 2021 ඔක්තෝබර් 14, කොළඹ, ශ්‍රී ලංකාව:** වර්ෂ 2021 ඔක්තෝම්බර් 8 වන දින ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කරන ලද අපරාධ නඩු විධාන සංග්‍රහ පනත සංශෝධනය කිරීමට යෝජිත පනත් කෙටුම්පත සම්බන්ධයෙන් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය ස්වකීය දැඩි කනස්සල්ල පලකර සිටී. සාමාන්‍ය තත්ත්වයක දී අධිකරණයට ඉදිරිපත් කරනු ලබන සැකකරුවෙකු හෝ චූදිතයකු මහේස්ත්‍රාත්වරයා හෝ මහාධිකරණ විනිසුරුවරයා හමුවට ඉදිරිපත් කිරීමේ අවශ්‍යතාවය බැහැර කිරීමට මෙම සංශෝධනය ඔස්සේ උත්සහ දරයි. ස්ථිර සංශෝධනයක් වශයෙන් යෝජනා කරන ලද මෙම පනත් කෙටුම්පත වූ කලී අත්අඩංගුවේ දී වධහිංසා පැමිණවීම හා අපයෝජනය කිරීම සාමාන්‍ය දෙයක් බවට පත් වී ඇති සන්දර්භයක් පවතින ශ්‍රී ලංකාවේ අපරාධ යුක්ති විනිශ්චය පද්ධතියේ පවතින ගැටලු සැලකිල්ලට ගනිමින් ඇගයීමට ලක් කළ යුතුය. වධහිංසා වලින් නිදහස් වීම සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය සහතිකය ලබා දී තිබියදීත්, දශක ගණනාවක් තිස්සේ පැවති පූර්වාදර්ශයන් තුළින් පෙන්නුම් කරනු ලබන්නේ වරදවල් සඳහා දඬුවම් නොලබා සිටීමේ සංස්කෘතියක් ඇති කරමින් මෙම මූලික අයිතිය ආරක්ෂා කිරීම සඳහා සාධනීය මට්ටමේ පියවර සඳහා අවැසි කටයුතු කිරීමට රජය පාර්ශවයෙන් අඛණ්ඩ අසමත්භාවයක් පෙන්නුම් කර තිබීමයි. එවන් වූ සන්දර්භයක් තුළ, යෝජිත සංශෝධන මඟින් පවතින ගැටලු තවදුරටත් උග්‍ර කිරීමට ඉඩ ප්‍රස්ථාව ඇති හෙයින් මෙකී පනත් කෙටුම්පත ඉදිරියට ගෙන නොයන ලෙසට ඒ සම්බන්ධයෙන් දැඩි කනස්සල්ලට පත්ව සිටින විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් ආණ්ඩුවෙන් ඉතා ඕනෑකමින් ඉල්ලා සිටී.

අපයෝජනය හා වධහිංසා කිරීමේ සංස්කෘතියට අමතරව, එවැනි ප්‍රවේශය සහතික කරන නෛතිකමය ආරක්ෂාවක් තිබියදීත්, රැඳවියන්ට ස්වකීය නීතිඥයින් වෙත අර්ථවත් අන්දමින් ප්‍රවේශවීමේ හැකියාව නැවත නැවතත් වළක්වාලනු ලැබේ. එවැනි පසුබිමක් තුළ, අපයෝජනය හා වධහිංසා පැමිණවීම සම්බන්ධයෙන් වන වාර්තා මඟින් එකී තත්ත්වය වඩාත් තීව්‍ර වී ඇති අවස්ථාවක සැකකරුවන් හෝ චූදිතයන් අධිකරණයට ඉදිරිපත් කිරීම ඔවුන්ගේ ආරක්ෂාව සහ යහපැවැත්ම පිළිබඳ සංවරණ තත්ත්වයක් ඇති කිරීම උදෙසා අධිකරණයට ක්‍රියා කළ හැකි එක් ආකාරයකි. එවැනි අත්‍යවශ්‍ය ආරක්ෂාවක් ස්ථිර වශයෙන්ම ඉවත් කිරීම පිළිගත නොහැකි මෙන්ම දැඩි කනස්සල්ලට ද හේතු වන්නේ  ය.

තවද, මෙම පනත් කෙටුම්පතේ දක්වා ඇති පරිදි පුද්ගලිකව පෙනීසිටීම බැහැර කළ හැකි හේතු පුළුල්, අපැහැදිලි සහ බලධාරීන්ගේ අපයෝජනයට ලක් විය හැකි අන්දමින් පවතී. නිදසුනක් වශයෙන්, සැකකරුවෙකු ඉදිරිපත් නොකිරීමට ඇති හේතු අතර, 'සැකකරු හෝ චූදිතයා විසින් උසාවියේ කටයුතුවලට බාධා කිරීමේ සම්භාවිතාවක් තිබේ නම්' එසේ සිදුවිය හැකිය. මෙකී පනත් කෙටුම්පතට අනුව නීතිපතිවරයා, අදාළ පොලිස් ස්ථානය භාර ස්ථානාධිපතිවරයා හෝ බන්ධනාගාර අධිකාරිවරයා විසින් එවැනි බාධා කිරීමක් ඇති විය හැක්කේ කවර අවස්ථාවක දී ද, නැතහොත් එවන් බාධා කිරීමක් සංස්ථාපනය වන්නේ කුමන තත්ත්වයක් යටතේ ද යන්න තීරණය කරන්නේ කෙසේදැයි පැහැදිලි නැත.

අවසාන වශයෙන්, මෙම පනත් කෙටුම්පතෙහි අරමුණ සහ එය ඉදිරිපත්ව ඇති අවස්ථාව පිළිබඳව ද විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය ස්වකීය අවධානය යොමු කරනු ලබන අතර, ශ්‍රී ලංකාවේ අපරාධ යුක්ති විනිශ්චය පද්ධතියෙහි කඩිනම් අවධානයක් යොමු කළ යුතු අභියෝග රැසකට මුහුණ දී සිටින අවස්ථාවක එවන් ගැටලුකාරී සියලු තත්ත්වයන් අභිබවා වර්තමාන පනත් කෙටුම්පතට වඩා වැඩි ප්‍රමුඛතාව ලැබී ඇත්තේ ඇයිද යන්න පිළිබඳව කිසිදු තොරතුරක් වෙත මහජනතාවට ප්‍රවේශ වීමේ හැකියාව නොමැත. මෙම පනත් කෙටුම්පත සම්බන්ධයෙන් කටයුතු කිරීම කෙරෙහි දක්වන කඩිනම් උනන්දුව සලකා බලන විට, ඒ හා සමාන අනෙකුත් වැඩකටයුතු වලදී කාරක සභා පිහිටුවීම හා සාකච්ඡා පැවැත්වීම ද ඇතුළුව පවතින තත්වයන්  හා ගත් කළ වෙනසක් පෙන්නුම් කරනු ලබන්නේ මෙකී වර්තමාන පනත් කෙටුම්පත සම්බන්ධයෙන් එවන් උනන්දුවක් නොපෙන්වන බැවිනි. මෙම පනත් කෙටුම්පත ක්‍රියාත්මක වුවහොත්, අත්අඩංගුවේ සහ රැඳවුම්භාරයෙහි සිටින රැඳවියන්ගේ ආරක්ෂාව සඳහා සැලකිය යුතු අගතිදායක ප්‍රතිවිපාකයන් ඇති කරන සේම එමඟින් තවදුරටත් ශ්‍රී ලංකාවේ රැඳවුම්භාරයෙහි සිටින්නන් වධහිංසාවට ලක් වීම වෙනස් කළ නොහැකි තත්ත්වයකට පත්වනු  ඇත.